# ශ්‍රී ලංකාවේ පශ්චාත් ආපදා කළමනාකරණය සහ බල සම්බන්ධතාව: අරණායක සාමසර කන්ද නායයාම පිළිබඳ සමාජවිද්‍යාත්මක විශ්ලේෂණය

එච්.ජී.අයි.එස්. සමරසිංහ - සමාජවිද්‍යා අධ්‍යයනාංශය

ස්වාභාවික ආපදා මිනිස් ජීවිතයේ අනුශාංගික අංගයක් බවට පරිවර්තනය වී ඇත. ගෝලීය පරිමණ්ඩලය තුළ සමකාලීන අවධිය වන විට ස්වාභාවික ආපදා ශීඝ්‍රයෙන් වර්ධනය වන හෙයින් පශ්චාත් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ බහුමානීය කතිකා නිර්මාණය වී පවතී. එම කතිකාවල කේන්ද්‍රීය සාධකය ලෙස බල දේශපාලනය හඳුනාගත හැකි අතර එය විවිධ ස්වරූප ඔස්සේ බලාත්මක වන ආකාරයද වැදගත් වේ. එසේ හෙයින් පශ්චාත් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය හා බලය අතර පවතින සම්බන්ධතාව කෙබඳු ද? යන පර්යේෂණ ගැටලුවට අදාළව ස්වාධීන අධ්‍යයනය දියත් කරන ලදී. ඒ 2016 වර්ෂයේ සිදුවූ අරණායක සාමසර කන්ද නායයාම ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක් වශයෙන් උපයුක්ත කර ගනිමිනි. මිශ්‍ර පර්යේෂණ ක්‍රමය හා ඊට අදාළ සෙසු ශිල්ප ක්‍රම උපයුක්ත කර ගනිමින් ස්වාධීන අධ්‍යයනයක් සිදු කරන ලද්දේ නායයාමෙන් විපතට පත් වූ පවුල් 55ක් නැවත පදිංචි කර ඇති නාරංගම්මන වසමට අනුයුක්තව ස්ථාපිත වසන්තගම ග්‍රාමයේය. දත්ත රැස් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ එන සම්මුඛ සාකච්ඡා ක්‍රමයත්, නිරීක්ෂණ ක්‍රමය යටතේ එන සෘජු නිරීක්ෂණ ක්‍රමය හා සමීක්ෂණ ක්‍රමය යටතේ පර්යේෂක විසින් පුරවනු ලබන ප්‍රශ්නාවලි ක්‍රමයත් උපයෝගී කර ගන්නා ලදි. සංගහණයම ආවරණය වන පරිදි ප්‍රශ්නාවලි පිරවීමෙන් අනතුරුව අරමුණු සහගත නියැදි ක්‍රමය භාවිත කරමින් ප්‍රතිචාර දක්වන්නන් 16 දෙනෙකු සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී කරගත් අතර, රැස් කරන ලද දත්ත විශ්ලේෂණය කිරීම සඳහා මූලික වශයෙන් තේමා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමයත්, ආඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමයත් භාවිත කරන ලදි. ඒ මගින් පශ්චාත් ආපදා කළමනාකරණ ක්‍රියාවලියට අදාළව බල සම්බන්ධතාව ප්‍රධාන බල ව්‍යූහ ත්‍රිත්වයක් යටතේ හඳුනා ගන්නා ලදි. ඒ විධිමත් ආයතනික බලය යෙදවීම, බිම් මට්ටමේ සමාජ කණ්ඩායම්වල පවත්නා බල සම්බන්ධතා හා පක්ෂ දේශපාලන බල යාන්ත්‍රණය වශයෙනි. එමෙන්ම එම තේමා ත්‍රිත්වය යටතේ බල සම්බන්ධතාවල පවත්නා තවත් උපව්‍යූහයන් අනාවරණය වූ අතර, මෙම ක්‍රියාවලිය තුළ බල සාධකය පුළුල් පරාසයක් තුළ විවිධ ස්වරූප යටතේ පැතිරී පවතින බවත් පැහැදිලි විය. මෙම ක්‍රියාවලිය ජාතික මට්ටමේ සහ පක්ෂ දේශපාලනයේ බලය යෙදවීම බිම් මට්ටමේ සමාජ කණ්ඩායම් කෙරෙහි බලපා ඇති ආකාරය මෙම අධ්‍යයනය මගින් අවධාරණය කරනු ලබයි. ඒ අනුව පශ්චාත් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය හා බලසම්බන්ධතාව අතර ප්‍රතිජනනාත්මක සම්බන්ධතාවක් පවතින බව නිගමනය කළ හැකි වේ.

***ප්‍රමුඛ පද:*** *ස්වාභාවික ආපදා, පශ්චාත් ආපදා කළමනාකරණය, බල සම්බන්ධතාව*